1969 දෙසැ. 3

# කර්මාන්ත සංවර්ධන

ලංකාවේ කර්මාන්තවලට ධෛර්යදීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධන මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන පොදු බලමණ්ඩලයක් පිහිටුවීම සඳහා ද; කර්මාන්ත උපදේශක සභාවක් හා කර්මාන්ත මූලමණ්ඩල පිහිටුවීම සඳහා ද; කර්මාන්ත සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමති විසින් ඉදිරිපත් කරන ලදී.

1969

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

# කර්මාන්ත සංවර්ධන

එල්. ඩී.—ඕ. 3/66

ලංකාවේ කර්මාන්තවලට යෙදවීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධන මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන පොදු බලමණ්ඩලයක් පිහිටුවීම සඳහා ද; කර්මාන්ත උපදේශක සභාවක් හා කර්මාන්ත මූලමණ්ඩල පිහිටුවීම සඳහා ද; කර්මාන්ත සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමතිය අනු ව හා ඇති ව, එයි ම බලය ප්‍රකාර අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

1. මෙම පනත 1960 අංක      දරන කර්මාන්ත සංවර්ධන පනත යනුවෙන් හැඳින්විය හැකි අතර ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් නියම කළ හැකි, මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කෙරෙන යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

*ලංකාවේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය පිහිටුවීම ආදිය.*

2. මේ පනතේ දැක්වෙන කාර්යයන් සඳහා මේ පනතේ මීට පසුව එන විධිවිධාන අනු ව —

(අ) කර්මාන්ත උපදේශක සභාවක්,

(ආ) ඇමතිවරයා විසින් නිශ්චය කළ හැකි කර්මාන්ත මූලමණ්ඩල සංඛ්‍යාවක්,

(ඇ) කර්මාන්ත සංවර්ධන අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක්, හා

(ඈ) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කෙරෙන, ලංකාවේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන මණ්ඩලයක්

පිහිටුවිය යුතු ය.

## I වන කොටස

## කර්මාන්ත උපදේශක සභාවක් සහ කර්මාන්ත මූලමණ්ඩල පිහිටුවීම

*කර්මාන්ත උපදේශක සභාව සහ එහි කාර්යයන්.*

3. (1) ලංකාවේ කර්මාන්ත වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වූ කරුණු පිළිබඳ ව ඇමතිවරයාට උපදෙස් දීම පිණිස මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන හා "කර්මාන්ත උපදේශක සභාව" යනුවෙන් හැඳින්විය යුතු සභාවක් තිබිය යුතු ය.

(2) ඇමතිවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකුගෙන් සහ සංඛ්‍යාවෙන් විස්සකට වැඩි නො වන වෙනත් සාමාජිකයන්ගෙන් සභාව සමන්විත විය යුතු ය. සභාවේ කාර්යයන් හා යුතුකම් මේ පනතේ විධිවිධානවලට යටත් ව නියෝග මගින් නියම කළ යුතු ය.

1——ජේ 4463—300 (6/7)

*කර්මාන්ත මූල මණ්ඩල පිහිටුවීම සහ ඒවායේ කාර්යයන්.*

4. (1) ඇමතිවරයා විසින්, යම් කර්මාන්ත පන්තියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් හෝ කර්මාන්ත සංවර්ධනයට අදාළ වූ නියමිත යම් කරුණක් සම්බන්ධයෙන් කර්මාන්ත මූලමණ්ඩල පිහිටුවිය යුතු ය.

(2) මෙහි මින් මතු "මූලමණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන එක් එක් කර්මාන්ත මූලමණ්ඩලය ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි සභාපතිවරයකුගෙන් හා වෙනත් සාමාජිකයන් ගෙන් සමන්විත විය යුතු ය. මූලමණ්ඩලයේ කාර්යයන් හා යුතුකම් නියෝග මගින් නියම කළ යුතු ය.

*කර්මාන්ත මූල මණ්ඩලවල වියදම්.*

5. කර්මාන්ත මූලමණ්ඩලවල (මූලමණ්ඩල සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ඇතුළු) පරිපාලන වියදම් මණ්ඩලය විසින් දැරිය යුතු ය.

## II වන කොටස

## කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම සහ පරිපාලනය කිරීම

*කර්මාන්ත සංවර්ධන අරමුදල.*

6. ලංකාවේ කර්මාන්තවලට ධෛර්යදීම, ඒවා වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම පිණිස මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන හා කර්මාන්ත සංවර්ධන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් මහා භාණ්ඩාගාරයෙහි පිහිටුවිය යුතු ය.

*අරමුදලට ගෙවීම.*

7. ඒ අරමුදලට —

(අ) 12 වන වගන්තිය යටතේ අය කරනු ලබන කර්මාන්ත සංවර්ධන සෙස් බද්දෙන් ලැබෙන මුදල් ;

(ආ) 9(1) වන වගන්තියෙහි දැක්වෙන ආකාරයට නියමිත භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් වූ බලපත්‍ර ගාස්තුවලින් ලැබෙන මුදල් ;

(ඇ) 9(2) වන වගන්තියෙහි දැක්වෙන ආකාරයට නියමිත කර්මාන්ත වර්ග වෙනුවෙන් වූ ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් ලැබෙන මුදල් ;

(ඈ) අරමුදලේ කාර්යයන් සඳහා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් කලින් කල නියම කළ හැකි සියලු ම මුදල් ;

(ඉ) 8 වන වගන්තිය යටතේ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල් ; සහ

(ඊ) මේ පනත යටතේ හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ අරමුදලට ගෙවිය යුතු ය සි නියම කෙරෙන සියලු ම මුදල් ගෙවිය යුතු ය.

*අරමුදලට ලැබෙන පරිත්‍යාග.*

8. (1) යම් තැනැත්තකු විසින් අරමුදලට කරනු ලබන පරිත්‍යාග භාණ්ඩාගාරයේ ලේකම් විසින් භාරගෙන අරමුදලට බැර කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පරිත්‍යාගයක් කරන යම් තැනැත්තකු විසින් ඒ පරිත්‍යාගය ප්‍රයෝජනයට ගත යුතු කාර්යය නිශ්චිත ව දක්වන අවස්ථාවක ඒ පරිත්‍යාගය ඒ කාර්යය සඳහා පමණක් ප්‍රයෝජනයට ගත යුතු ය.

*7 වන වගන්තියෙහි සඳහන් ගාස්තු හා බදු අරමුදලට ගෙවිය යුතු ආකාරය.*

9. (1) ආනයනය කිරීම් සඳහා ආනයන හා අපනයන (පාලන) පනත යටතේ පනවනු ලැබූ නියෝග යටතේ බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුත්තේ යම් භාණ්ඩ වෙනුවෙන් ද ඒ භාණ්ඩවල යම් විස්තරයක් 7 වන වගන්තියේ කාර්යයන් සඳහා මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව ඇමතිවරයා විසින් නිශ්චිත ව දක්වන අවස්ථාවක ආනයන හා අපනයන පාලක විසින්, ඒ භාණ්ඩ සම්බන්ධයෙන් එකතු කරනු ලබන ආනයන පාලන ගාස්තු අරමුදලට බැර කළ යුතු ය.

(2) ඇමතිවරයා විසින් මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව, 7 වන වගන්තියේ කාර්යයන් සඳහා යම් ව්‍යාපාර වර්ගයක් හෝ විස්තරයක් නිශ්චිතව සඳහන් කරන අවස්ථාවක ඒ ව්‍යාපාරයේ වර්ගය හෝ විස්තරය සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් විසින් එකතු කරනු ලබන ව්‍යාපාර පිරිවැටුම් බද්ද අරමුදලට බැර කළ යුතු ය.

(3) මෙම වගන්තියෙහි—

"ආනයන හා අපනයන පාලක" යන්නෙන් ආනයන හා අපනයන (පාලන) පනත යටතේ පත් කරනු ලැබූ ආනයන හා අපනයන පාලක අදහස් වේ;

"ව්‍යාපාරික පිරිවැටුම් බද්ද" යන්න 1963 අංක 11 දරන මුදල් පනතේ XII වන කොටසේ ඊට දී ඇති අර්ථය ම දරයි;

"දේශීය ආදායම් කොමසාරිස්" යන්නෙන් 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරනු ලැබූ දේශීය ආදායම් කොමසාරිස් අදහස් වේ.

(4) 7 වන වගන්තියේ සඳහන් ගාස්තු හා බදු සාර්ථක ලෙස එකතු කිරීම හා බැර කිරීම සඳහා අවශ්‍ය සියලු කරුණු සම්බන්ධයෙන් නියෝග පැනවිය හැකි ය.

*අරමුදලේ පරිපාලනය.*

10. (1) අරමුදල, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය හා පරිපාලනය යටතේ තිබිය යුතු ය.

(2) භාණ්ඩාගාරයේ ලේකම් විසින් එක් එක් ලිත් වර්ෂය අවසාන වීමෙන් පසු හැකි පමණ ඉක්මණින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් සූදානම් කළ යුතු ය;

(3) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් එක් එක් ලිත් වර්ෂය වෙනුවෙන් අරමුදල පිළිබඳව සම්පූර්ණයෙන් හා සුද්ධ ලෙස ගණන් තැබීමට සැලැස්විය යුතු ය.

(4) එක් එක් වර්ෂය සඳහා වූ අරමුදලේ ගණන් ගණන් පරීක්ෂකාධිකාරී විසින් හෝ ඔහුගේ විධානය යටතේ පරීක්ෂා කළ යුතු ය.

(5) අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් (අරමුදලේ ගණන් පිළිබඳ ව ගණන් පරීක්ෂකාධිකාරීගේ වාර්තාව සමඟ) ඇමතිවරයා විසින් උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තැබිය යුතු ය.

*අරමුදලෙන් කරනු ලබන ගෙවීම්.*

11. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින්—

(අ) ඇමතිවරයා විසින් මුදල් ඇමතිවරයා විමසා කලින් කල නිශ්චය කළ හැකි යම් මුදලක් මණ්ඩලය වෙත; සහ

(ආ) ඇමතිවරයා විසින් මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව ලංකාවෙහි කර්මාන්ත වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ය යි කලින් කල නිශ්චය කළ හැකි යම් මුදලක් (නීතිගත කරනු ලැබූ හෝ නීතිගත කරනු නො ලැබූ) වෙන යම් ආයතනයක් හෝ පුද්ගල මණ්ඩල යක් වෙත

අරමුදලෙන් ගෙවිය යුතු ය.

කර්මාන්ත සංවර්ධන සෙස් බද්ද.

12. (1) මේ පනතේ කාර්යයන් සඳහා යම් කර්මාන්තයක් හෝ කර්මාන්ත සම්බන්ධයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කර ගැනීමෙන් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයක හා යම් ප්‍රමාණයක වූ කර්මාන්ත සංවර්ධන සෙස් බද්ද යනුවෙන් හැඳින්වෙන සෙස් බද්දක් නියම කිරීම, අය කිරීම සහ ගෙවීම කළ යුතු ය. ඒ සෙස් බදු මුදල් අරමුදලට බැර කළ යුතු ය.

(2) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ සම්මත කරනු ලබන යම් යෝජනාවක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අවලංගු කිරීම හෝ කලින් කල සංශෝධනය කිරීම කළ හැකි ය.

(3) කර්මාන්ත සංවර්ධන සෙස් බද්ද සාර්ථක ලෙස අය කිරීම හා එකතු කිරීම සඳහා ද එය අරමුදලට ගෙවීම සඳහා ද අවශ්‍ය සියලු කරුණු සම්බන්ධයෙන් නියෝග පැනවිය හැකි ය.

## III වන කොටස

## ලංකාවේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය.

ලංකාවේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය.

13. ලංකාවේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය යනුවෙන් හැඳින් විය යුතු මණ්ඩලයක් පිහිටුවිය යුතු ය.

මණ්ඩලය නීතිගත සංස්ථාවක් විය යුතු බව.

14. 13 වන වගන්තියෙන් මණ්ඩලයට පැවරුණු නමින් ඒ මණ්ඩලය නීතිගත සංස්ථාවක් විය යුතුවාත් හැර අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් එයට තිබිය යුතු ය. එමෙන් ම ඒ නමින් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධ ව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

මණ්ඩලයේ පරමාර්ථ.

15. මණ්ඩලයේ පරමාර්ථ—

(අ) ලංකාවෙහි කර්මාන්තවලට ධෛර්යදීම, ඒවා වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ ව සහාය දීම;

(ආ) රටෙහි ආර්ථික ක්‍රමයට අයත් පෞද්ගලික හා රජයේ අංශ යන්හි සියලු කර්මාන්ත ව්‍යවසායන්ගේ නිසි සම්බන්ධතාවය හා අන්‍යෝන්‍ය කර්මාන්ත සංවර්ධනය පිළිබඳ ව සහාය වීම;

(ඇ) ලංකාවේ ස්වාභාවික ධන සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ, කර්මාන්ත සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලබන කාර්මික ක්‍රියාමාර්ග හා ක්‍රම දියුණු කිරීමේ, දේශීය කර්මාන්ත සඳහා උචිත කාර්මික විද්‍යාව හා උපකරණ සංවර්ධනය කිරීමේ

සහ අපනේ යන නිෂ්පාදන වඩාත් හොඳින් ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රියාමාර්ගය හා ක්‍රම සොයා ගැනීමේ පරමාර්ථය ඇති ව කර්මාන්ත පර්යේෂණ වර්ධනය කිරීම;

(ඈ) දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳ පොළවල් වලට අපනයනය කිරීම වර්ධනය කිරීම;

(ඉ) කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය හෝ හිතකර ජාත්‍යන්තර වෙළඳ හා ප්‍රාදේශීය සහයෝගතා ක්ෂේත්‍රයෙහි කටයුතු වලට සහාය වීම;

(ඊ) ලංකාවෙහි යම් කර්මාන්ත ව්‍යවසායක් හෝ කර්මාන්ත ආයතනයක් විසින් හෝ සම්බන්ධයෙන් අවශ්‍ය මූලධනය, ණය, අලෙවි කිරීම්, පාලනමය හා කර්මාන්ත පහසුකම් ඇතුළු ව සෑම විස්තරයකට අයත් සේවාවන් හා පහසුකම් සැලසීම;

(උ) ලංකාවේ කර්මාන්ත වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වූ කරුණු ගැන උපදෙස් දීම; සහ

(ඌ) මේ වගන්තියේ නිශ්චිත ව සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය හෝ ඒවාට හිතකර විය හැකි සියලු පියවරවල් ගැනීම

විය යුතු ය.

තම පරමාර්ථ සපුරාලීම සඳහා තම බලතල මණ්ඩලය විසින් පාවිච්චි කළ යුතු බව.

16. මණ්ඩලයේ පරමාර්ථ සපුරාලීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්, මේ පනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් හෝ ඒවා යටතේ මණ්ඩලය වෙත පැවරෙන හෝ නියම කෙරෙන බලතල, කාර්යයන් හා යුතුකම් පාවිච්චි කිරීම, කිරීම හා ඉටු කිරීම කළ හැකි ය.

මණ්ඩලයේ සංයුතිය.

17. (1) මණ්ඩලය සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන්—

(අ) සාමාජිකයන් සය දෙනකු ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය;

(ආ) එක් සාමාජිකයකු ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු භාරව සිටින ඇමතිවරයා විමසීමෙන් පසු ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය;

(ඇ) එක් සාමාජිකයකු මුදල් ඇමතිවරයා විමසීමෙන් පසු ඇමතිවරයා විසින් පත් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නිලධරයකු විය යුතු ය; තව ද

(ඈ) එක් සාමාජිකයකු මුදල් ඇමතිවරයා විමසීමෙන් පසු ඇමතිවරයා විසින් පත් කරනු ලබන මහා බැංකුවේ නිලධරයකු විය යුතු ය.

(2) ඇමතිවරයා විසින්, මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් කෙනකු මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කළ යුතු ය.

නුසුදුසුකම්.

18. උත්තර මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුසු විය යුතු ය.

19. සෑම සාමාජිකයකු විසින්, ඔහු කලින් ධුරය අත්හැර යන්නේ නම් හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

20. අසනීප වීම, ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙන යම් හේතුවක් නිසා යම් සාමාජිකයකුට තම ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත් ඔහු වෙනුවට සාමාජිකයකු වශයෙන් වැඩ බැලීම සඳහා ඇමතිවරයා විසින් වෙන යම් තැනැත්තකු පත් කළ හැකි ය.

වැඩ බලන සාමාජිකයන් පත් කිරීම.

21. (1) සාමාජිකයකු විසින් ඇමතිවරයා වෙත යැවෙන ලිපියකින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යානුකූල ය යි ඇමතිවරයා සිතන්නේ නම් ඔහු විසින් එසේ කළ හැකි ය.

සාමාජිකයන් ඉල්ලා අස්වීම හා ඉවත් කරනු ලැබීම.

22. කාලය ගෙවී යෑම නිසා ධුරය අත්හරින සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය.

නැවත පත් කිරීම සඳහා සාමාජිකයන් සුදුසුවීම.

23. මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය පස් දෙනකු විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය.

24. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම් හා ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම පිළිබඳ කාර්ය පරිපාටිය විධිමත් කළ හැකි ය.

මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පරිපාටිය.

25. මණ්ඩලයේ සාමාජිකයින් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයන්ගෙන් යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් එහි යම් ක්‍රියාවක් හෝ කාර්යයක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.

සාමාජිකයින් අතර පුරප්පාඩුවක් නිසා මණ්ඩලයේ ක්‍රියා අවලංගු නොවීම.

26. මුදල් ඇමතිවරයා විමසීමෙන් පසු ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට හා ප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය.

27. (1) මණ්ඩලයට පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එය මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කළ හැකි තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව.

(2) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් මණ්ඩලයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු නීත්‍යනුකූල ලේඛනයකට හෝ ලේඛනයකට නො තැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා ම ඔවුන්ගේ පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් ඒ නීත්‍යනුකූල ලේඛනය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

(4) මණ්ඩලය විසින්, මණ්ඩලයේ මුද්‍රාව තැබූ නීත්‍යනුකූල ලේඛනවල හෝ ලේඛනවල නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

28. (1) තම බලතල, කාර්යයන් හා යුතුකම් පාවිච්චි කිරීමෙහි, කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා මණ්ඩලය ඇමතිවරයා විසින් කලින් කල නිකුත් කළ හැකි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු අතර මණ්ඩලය විසින් ඒ සාමාන්‍ය හෝ විශේෂ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

මණ්ඩලය වෙත ඇමතිවරයා විසින් කරනු ලබන විධාන.

(2) වෙන යම් ඇමතිවරයකු වෙත පැවරුණු කාර්යයන්ට බලපාන යම් කරුණක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ විධාන නිකුත් කිරීමෙහි ලා ඇමතිවරයා විසින් ඒ ඇමතිවරයා විමසා ක්‍රියා කළ යුතු ය.

29. මණ්ඩලයේ සියලුම සාමාජිකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව හා ඒ සංග්‍රහයේ කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සැලකීම.

30. (1) මණ්ඩලය විසින් එහි බලතල හෝ යුතුකම්වලින් යමක් මණ්ඩලයේ යම් සාමාජිකයකු වෙත හෝ මණ්ඩලයේ යම් සේවකයකු වෙත පැවරිය හැකි ය.

මණ්ඩලය විසින් යුතුකම්, කාර්යයන් හා බලතල පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සෑම නියෝජිතයකු ම ඔහු වෙත පවරනු ලැබූ බලය හෝ යුතුකම මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් ව පාවිච්චි කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

## IV වන කොටස

## මණ්ඩලයේ යුතුකම් හා බලතල

31. (අ) මණ්ඩලයේ පරමාර්ථවලින් අදහස් කරන යම් සේවාවන් හැකි පමණින්,—

මණ්ඩලයේ යුතුකම්.

(i) රජයට හෝ රජයේ යම් දෙපාර්තමේන්තුවකට, හෝ

(ii) ලංකාවෙහි කර ගෙන යනු ලබන හෝ කර ගෙන යනු ලැබීමට අදහස් කරන යම් කර්මාන්තයකට, හෝ

(iii) රජයේ අනුග්‍රහය ලබන යම් නීතිගත සංස්ථාවකට, හෝ

(iv) රජයේ යම් නියෝජ්‍යතන්ත්‍රයකට, හෝ

(v) යම් ප්‍රාදේශීය බලමණ්ඩලයකට

සැලසීම ;

(ආ) එහි පරමාර්ථයන් සපුරාලීම පිණිස අවශ්‍ය විය හැකි සියලු පියවරවල් ගැනීම ;

(ඇ) මේ පනත යටතේ පිහිටුවනු ලබන කර්මාන්ත' මූල මණ්ඩලවල වාර්තා හා නිර්දේශ මණ්ඩලයේ අදහස් සමග ඇමතිවරයා වෙත ඉදිරිපත් කිරීම ; සහ

(ඈ) මණ්ඩලයේ අදහස් අනුව හෝ ඇමතිවරයාගේ ඉල්ලීම පිට කර්මාන්ත වැඩිදියුණු කිරීමට හා සංවර්ධනය කිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් ඇමතිවරයාට උපදෙස් දීම

මණ්ඩලයේ යුතුකම විය යුතු ය.

32. යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් ඉදිරිපිට වූ නීති කෘත්‍යයකින් ක්‍රියාත්මක කළ හැකි, 31 වන වගන්තිය නිසා නොවී නම් මණ්ඩලය යටත් කළ නො හැකි, යම් ආකාරයක යුතුකමක් හෝ බැඳීමක් ඒ වගන්තියෙහි වූ කිසිවකින් මණ්ඩලය වෙත පැවරෙතැයි තේරුම් නො ගත යුතු ය.

*මණ්ඩලයේ කිසිදු යුතුකමක් අධිකරණයේ දී ක්‍රියාත්මක නො කළ යුතු බව.*

33. (1) මණ්ඩලයේ පරමාර්ථයන් මුදුන්පමුණුවා ගැනීමට අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි සියලු ක්‍රියා කිරීමටත් සියලු පියවර ගැනීමටත් මණ්ඩලයට බලය තිබිය යුතු ය.

*මණ්ඩලයේ බලතල.*

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැති ව—

(අ) ලංකාවේ කර්මාන්ත වතු පිහිටුවීම, නඩත්තු කිරීම හා කර ගෙන යාම සඳහා ;

(ආ) ලංකාවෙහි නිෂ්පාදිත කර්මාන්තමය භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමෙහි හෝ බෙදාහැරීමෙහි නියුක්තවීම හෝ එකී ලා දේශීය ආයතන හෝ පුද්ගල මණ්ඩල හෝ විදේශීය ආයතන හෝ ආණ්ඩු සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා ;

(ඇ) මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම පිණිස අවශ්‍ය හෝ හිතකර කර්මාන්ත යන්ත්‍රෝපකරණ හෝ අමු ද්‍රව්‍ය මිලට ගැනීමෙහි ලා, හෝ වෙන යම් පහසුකම් සැලසීමෙහි ලා හෝ යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමෙහි ලා යම් ප්‍රාදේශීය බලමණ්ඩලයකට, රජයේ අනුග්‍රහය ලබන නීතිගත සංස්ථාවකට හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ යම් තැනැත්තකුට හෝ (නීතිගත කරන ලද හෝ නීතිගත නො කරන ලද) පුද්ගල මණ්ඩලයකට මුදල් අතින් හෝ වෙනත් ආකාරයකින් සහායවීම සඳහා ;

(ඈ) මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් අදාළ වැඩ කිරීමට තැනැත්තන් පුහුණු කිරීම හෝ පුහුණු කිරීම සඳහා මුදල් අතින් සහායවීම සඳහා ;

(ඉ) කර්මාන්ත සංවර්ධනයට අදාළ යම් කර්මාන්ත ව්‍යවසායක ව්‍යාපාරයෙහි හෝ කටයුතුවල ඇමතිවරයා විසින් නිශ්චය කළ හැකි ආකාරයකට සහභාගිවීම සඳහා ;

(ඊ) මණ්ඩලය විසින් ඉටු කරනු ලබන සේවාවන්, සලසනු ලබන පහසුකම් හෝ උපකරණ වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම් ලබාගැනීම සඳහා ;

(උ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, තබා ගැනීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම හෝ කුලියට දීම, ඔඩපනයට යටත් කිරීම හෝ විකිණීම හෝ ඒ දේපළ සම්බන්ධයෙන් වෙනත් ආකාරයෙන් සුදුස්සක් කිරීම සඳහා ;

(ඌ) මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාවෙහි යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි යෙදවීම සඳහා ;

(එ) මණ්ඩලය විසින් සේවයේ යොදවනු ලබන තැනැත්තන් සඳහා මුදල් ආධාර, ශුභ සාධක හා විනෝද පහසුකම්, නිවාස, නේවාසිකාගාර හා ඒ හා සමාන වෙනත් ඉඩපහසුකම් සැලසීම සඳහා ;

(ඒ) මණ්ඩලයේ පරමාර්ථයන්ගේ කාර්යයන් සඳහා අවශ්‍ය යම් දෙයක් ඉදි කිරීම, නිෂ්පාදනය කිරීම, මිලට ගැනීම, නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා ;

(ඔ) මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට මණ්ඩලය විසින් ම හෝ මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත්වීම හා ඒවා ඉටු කිරීම හෝ කරගෙන යාම සඳහා ;

(ඕ) මේ පනතේ විධිවිධානවලට යටත් ව, මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන්ගේ පත්වීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික, විනයානුකූල පාලනය, ගැසීරීම සහ නිවාඩුදීම ඇතුළු ව ඒ නිලධරයන්ට හා සේවකයන්ට අදාළ ව්‍යවස්ථා පැනවීම සඳහා ;

(ක) මේ පනතේ විධිවිධානවලට යටත් ව මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ව්‍යවස්ථා පැනවීම සඳහා ; සහ

(ග) මණ්ඩලයේ මතය අනු ව එහි පරමාර්ථ නිසියාකාර ඉෂ්ට කිරීම හෝ එහි යුතුකම් ඉටු කිරීම පහසු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම සඳහා

මණ්ඩලයට බලය තිබිය යුතු ය.

V වන කොටස

## මණ්ඩලයේ මුදල් හා ගණන්

මණ්ඩලය විසින් මණ්ඩලයේ මුදල් පාවිච්චි කළ හැකි බව.

34. මණ්ඩලය විසින්, එහි පරමාර්ථ ක්‍රියාත්මක කර ගෙන යාමේ කාර්යය සඳහා හෝ මේ පනත හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ එහි බලතල, කාර්යයන් හා යුතුකම් පාවිච්චි කිරීමෙහි, කිරීමෙහි හෝ ඉටු කිරීමෙහි ලා මණ්ඩලයේ මුදල් පාවිච්චි කළ හැකි ය.

මණ්ඩලයේ ගණන්.

35. මණ්ඩලය විසින්, එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් එහි ආදායම හා වියදම සහ එහි වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ ව නිවැරදි ගණන් තැබීමට සැලැස්විය යුතු අතර ඇමතිවරයා විසින් නිශ්චය කළ හැකි යම් ආකෘතියක් අනුව හා එසේ නිශ්චය කළ හැකි විස්තර අඩංගු, එහි කටයුතුවලට අදාළ වාර්ෂික ගණන් හා සංඛ්‍යා ලේඛන ප්‍රකාශයක් පිළියෙළ කළ යුතු ය.

මණ්ඩලයේ මුදල් වර්ෂය.

36. මණ්ඩලයේ මුදල් වර්ෂය මණ්ඩලය විසින් නිශ්චය කළ හැකි පරිදි විය යුතු ය.

මණ්ඩලයෙ ගණන් ගණන් ප ණයට භා කිරීම.

37. (1) එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් වූ මණ්ඩලයේ ගණන් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු හයමාසයක් ගත වීමට පෙර ගණන් පරීක්ෂණයට භාජනය කිරීම සඳහා ගණන් පරීක්ෂකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ ගණන් ගණන් පරීක්ෂණයට භාජනය කිරීමෙහි ලා ඔහුට සහායවීමේ කාර්යය සඳහා ගණන් පරීක්ෂකාධිකාරී විසින්, ඔහුගේ විධානය හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු සුදුසුකම් ලත් යම් ගණන් පරීක්ෂකයකුගේ හෝ ගණන් පරීක්ෂකයන්ගේ සේවය ලබා ගත හැකි ය.

(2) මණ්ඩලයේ ගණන් ගණන් පරීක්ෂණයට භාජනය කිරීමෙහි ලා ගණන් පරීක්ෂකාධිකාරී විසින් දරනු ලබන වියදම් පියවීමේ කාර්යය සඳහා, මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව ඇමතිවරයා විසින් නිශ්චය කළ හැකි යම් පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ අරමුදල්වලින් ගණන් පරීක්ෂකාධිකාරී වෙත ගෙවිය යුතු ය. ගණන් පරීක්ෂකාධිකාරී විසින් මණ්ඩලයෙන් ලබා ගත් යම් පාරිශ්‍රමිකයක්, ඒ ගණන් පරීක්ෂණයේ කාර්යය සඳහා ඔහු විසින් සේවයේ යොදවා ගනු ලැබූ සුදුසුකම් ලත් යම් ගණන් පරීක්ෂකයකුට ඔහු විසින් ගෙවන ලද යම් මුදලක් අඩු කිරීමෙන් පසු ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(3) ගණන් පරීක්ෂණයේ කාර්යය සඳහා ගණන් පරීක්ෂකාධිකාරී විසින් අවශ්‍ය ය යි සැලකිය හැකි මණ්ඩලයේ සියලු පොත්, ඔප්පු, ගිවිසුම්, ගණන්, වවුචර් හා වෙනත් ලේඛන පරීක්ෂා කර බැලීමට ගණන් පරීක්ෂකාධිකාරීට හා මණ්ඩලයේ ගණන් පරීක්ෂණයට භාජනය කිරීමෙහි ලා ඔහුට සහාය වන යම් තැනැත්තකුට ඉඩ තිබිය යුතු අතර ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි තමන් දන්නා තොරතුරු මණ්ඩලය විසින් හෝ මණ්ඩලයේ නිලධරයන් විසින් ඔවුන් වෙත සැපයිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යයන් සඳහා "සුදුසුකම් ලත් ගණන් පරීක්ෂක" යන යෙදුමෙන්—

(අ) ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි සාමාජිකයකු ව, ගණකාධිකාරී කෙනකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයෙහි සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් හිමි ව සිටින පුද්ගලයකු; හෝ

(ආ) ඒ ආයතනයේ සාමාජිකයකු ව, එක් එක් සාමාජිකයා ගණකාධිකාරී කෙනකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ආයතනයෙහි සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් හිමි ව සිටින කොටස්කරුවන්ගෙන් යුත් වරලත් ගණකාධිකාරීන්ගේ ව්‍යාපාරික ආයතනයක්

අදහස් වේ.

ගණන් පරීක්ෂකාධිකාරීගේ වාර්තා

38. (1) ගණන් පරීක්ෂකාධිකාරී විසින් මණ්ඩලයේ ගණන් පරීක්ෂා කොට—

(අ) තමාට අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් තමා විසින් ලබා ගන්නා ලද්දේ ද නැද්ද යන බව ප්‍රකාශ කරමින්;

(ආ) වාර්තාවේ සඳහන් ගණන් මණ්ඩලයේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පිළිබිඹු වන සේ නිසි ආකාරයෙන් පිළියෙළ කර තිබේ ද යන බව ප්‍රකාශ කරමින්; සහ

(ඇ) මණ්ඩලයේ කටයුතු සහ ගණන් පිළිබඳ යම් පරීක්ෂණයක දී උත්තර මන්ත්‍රී මණ්ඩලයට හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට වැදගත් විය හැකි යැ යි තමා අදහස් කරන ගණන්වල යම් කරුණකට අවධානය යොමු කරමින් වාර්තාවක් සැපයිය යුතු ය.

(2) ගණන් පරීක්ෂකාධිකාරී විසින් ඔහුගේ වාර්තාව, පරීක්ෂා කරන ලද ගණන් සමඟ මණ්ඩලය වෙත යැවිය යුතු ය.

39. මණ්ඩලය විසින්, එක් එක් වර්ෂයේ පරීක්ෂණයට භාජනය කරන ලද ගණන් හා ගණන් පරීක්ෂකාධිකාරීගේ වාර්තාව ලැබීමෙන් පසු ඒ වාර්තාව හා ඒ ගණන්, ඒ වාර්තාව අදාළ වන්නේ යම් මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ මුදල් වර්ෂය තුළ මණ්ඩලයේ කටයුතු පිළිබඳ මණ්ඩලය විසින් පිළියෙළ කරන ලද ප්‍රකාශයක් සමඟ ඇමතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඇමතිවරයා විසින්, ඒවායේ පිටපත් ගණන් අදාළ වන මණ්ඩලයේ මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු මාස නවයක් ඇතුළත උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියේ තැබීමට සැලැස්විය යුතු ය.

ගණන් පරීක්ෂකාධිකාරීගේ වාර්තාව සහ මණ්ඩලයේ වාර්ෂික කටයුතු පිළිබඳ වාර්තාව ඇමතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.

40. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද ප්‍රධාන රේගු අයකැමි විසින් භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමතිය ඇති ව, මණ්ඩලය විසින් එහි යම් කාර්යයන් සඳහා ආනයනය කරන ලද භාණ්ඩ, තීරු ගාස්තුවලින් නිදහස් කළ හැකි ය.

තීරු ගාස්තුවලින් නිදහස් වීම.

41. (1) මණ්ඩලයේ කාර්යයන්ගෙන් යම් කාර්යයක් සඳහා අවශ්‍ය යම් මුදලක් හෝ මුදල් රජයෙන් හෝ යම් තැනැත්තකුගෙන් හෝ තැනැත්තන්ගෙන් ඇමතිවරයාගේ අනුමතියට යටත් ව මණ්ඩලය විසින් ණයට ගැනීම නීත්‍යනුකූල විය යුතු ය.

ණය ගැනීමේ බලතල.

(2) මණ්ඩලය විසින් ගනු ලබන සෑම ණය මුදලක් ම ඇමතිවරයා විසින් අනුමත කළ හැකි යම් පොළී ප්‍රමාණයකට හෝ ප්‍රමාණයන්ට සහ එය ආපසු ගෙවීමේ යම් කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) මණ්ඩලය විසින් ණයට ගනු ලබන යම් මුදල් ආපසු ගෙවීම සුරක්ෂිතවීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්, ඒ මුදල හෝ එහි යම් කොටසක් ණයට දිය හැක්කේ යම් ණය දෙන්නකු විසින් හෝ වෙනුවෙන් ද ඒ ණය දෙන්නා වෙත මණ්ඩලයට අයත් යම් දේපළක් උකස් කිරීම හෝ පැවරීම හෝ මණ්ඩලයට එකතු වන යම් මුදලකට ඇති හිමිකම් ඒ ණය දෙන්නා වෙත පැවරීම කළ හැකි ය.

## VI වන කොටස

### මණ්ඩලයේ කාර්ය මණ්ඩලය හා කාර්යාංශ

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.

42. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව මණ්ඩලය විසින්—

(අ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවයෙන් පහ කිරීම හා ඔවුන් පිළිබඳ විනයානුකූල පාලනය පවත්වා ගෙන යාම කළ හැකි ය;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කළ හැකි ය;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි නිශ්චය කළ හැකි ය;

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා අර්ථසාධක අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවා විධිමත් කළ හැකි අතර ඒ අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවිය හැකි ය.

මණ්ඩලයේ නියෝජ්‍යත්ව, කාර්යාංශ හා කොට්ඨාශ.

43. (1) මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු නිසි ලෙස හා ඵලදායී ලෙස පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ය යි මණ්ඩලය විසින් සැලකිය හැකි මණ්ඩලයේ යම් කාර්යාංශ, කොට්ඨාශ හෝ නියෝජ්‍යත්ව සංඛ්‍යාවක් මණ්ඩලය විසින් පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

(2) මණ්ඩලය විසින් මණ්ඩලයේ එක් එක් කාර්යාංශයට, කොට්ඨාශයට හෝ නියෝජ්‍යත්වයට පැවරිය හැකි මණ්ඩලයේ යම් ව්‍යාපාර කටයුතු කොටස පරිපාලනය කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඒ එක් එක් දෙපාර්තමේන්තුව, අංශය හෝ නියෝජ්‍යත්වය වගකිව යුතු ය.

(3) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් බලතල, කාර්යයන් හා යුතුකම් පාවිච්චි කිරීම, කිරීම හා ඉටුකිරීම ඒ එක් එක් කාර්යාංශයේ, කොට්ඨාශයේ හෝ නියෝජ්‍යත්වයේ ප්‍රධානියා හා ඒ කාර්යාංශයට, කොට්ඨාශයට හෝ නියෝජ්‍යත්වයට අනුයුක්ත කරනු ලැබූ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ අනෙක් සාමාජිකයන් විසින් කළ යුතු ය.

(4) මේ වගන්තියේ පෙරාතු ව වූ විධිවිධානවල සඳහන් සියලු කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් මේ පනත යටතේ නියෝග පැනවිය හැකි ය.

රජයේ නිලධරයන් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

44. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ භාණ්ඩාගාරයේ ලේකම්ගේ කැමැත්ත ඇති ව, මණ්ඩලය විසින්, ඒ හා සමාන කැමැත්ත ඇති ව නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කිරීම හෝ ස්ථිරව ඒ කාර්ය මණ්ඩලයට පත් කිරීම කළ හැකි ය.

(2) රජයේ සේවයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඔහු ඒ කාර්ය මණ්ඩලයේ වෙන යම් සාමාජිකයකු යටත් වන විනයානුකූල පාලනයට ම යටත් විය යුතු ය;

(ආ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහුගේ තාවකාලික පත්වීම සිදු වූ අවස්ථාවේ රජයේ සේවයේ ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ය යි ප්‍රකාශ කර තිබුණි නම් —

(I) මණ්ඩලයේ සේවයේ යෙදී සිටිය දී, රජයේ ප්‍රතිපත්තිය පිළිබඳ හේතු අනු ව වැටුප් රහිත ව දෙනු ලැබූ නිවාඩු පිට ඔහු රජයේ සේවයේ රාජකාරියට නො පැමිණ සිටි ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනු ව ඒ ව්‍යවස්ථාවල 10(1) වන වගන්තිය ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය; තවද,

(II) රජයේ සේවයේ ඔහුගේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවිය යුතු වැටුපෙන් ඇමතිවරයා විසින් නිශ්චය කළ හැකි සියයට විසිපහක ප්‍රමාණයකට වැඩි නො වූ මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස, ඔහු මණ්ඩලයේ සේවයේ යෙදී සිටින සෑම සම්පූර්ණ මාසයක් සඳහා ඔහු වෙනුවෙන් මණ්ඩලය විසින් මණ්ඩලයේ අරමුදලින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ගෙවිය යුතු ය; එමෙන් ම

(ඇ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහුගේ තාවකාලික පත්වීම සිදු වූ අවස්ථාවේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ඔහු දායකයකු ව සිටියේ නම් මණ්ඩලයෙහි ඔහුගේ සේවය ඒ ආඥාපනතේ කාර්යය සඳහා රජයේ සේවය ලෙස සැලකිය යුතු අතර, ඒ අනු ව, ඔහු මණ්ඩලයේ සේවයේ යෙදී සිටින තාක්, ඒ ආඥාපනත යටතේ ගෙවීමට ඔහු යටත් ව සිටි දායක මුදල ඔහු විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ඉදිරියටත් ගෙවිය යුතු ය. ඔහු සඳහා රජය විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට යටත් යම් දායක මුදලකට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ඒ නිලධරයාගේ ගිණුමට බැර කිරීම පිණිස එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී මණ්ඩලය විසින් ඔහු සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත යැවිය යුතු ය.

(3) රජයේ සේවයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක,—

(අ) ඔහු රජයේ සේවයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය;

(ආ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහුගේ ස්ථිර පත්වීම සිදු වූ අවස්ථාවේ රජයේ සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ය යි ප්‍රකාශ කර තිබුණි නම්,—

(I) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහුගේ ස්ථිර පත්වීම කරනු ලැබූ දිනයෙහි අයහපත් සෞඛ්‍යය හේතු කොට ගෙන රජයේ සේවයෙන් ඔහු විශ්‍රාම ගත්තේ නම් ඒ ව්‍යවස්ථා යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකි වූ යම් ප්‍රදානයක් ලැබීමට ඔහු සුදුසු විය යුතු ය;

(II) වයස නිසා හෝ අයහපත් සෞඛ්‍යය නිසා හෝ ඔහු විසින් මණ්ඩලයෙහි දරනු ලබන තනතුර අහෝසි කිරීමේ හේතුව නිසා හෝ මුදල් ඇමතිවරයා විසින් අනුමත කරන ලද වෙන යම් හේතුන් නිසා විශ්‍රාම ගැනීමෙන් මණ්ඩලයේ ඔහුගේ සේවය අවසන් කරනු ලැබුවහොත් මිස, ඒ ව්‍යවස්ථා යටතේ දෙන ලද එබඳු යම් ප්‍රදාන මුදලක් ඔහුට නො ගෙවිය යුතු ය; එමෙන් ම

(III) මණ්ඩලයේ සේවයේ යෙදී සිටිය දී ඔහු මියගියහොත්, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහුගේ ස්ථිර පත් වීමට පෙරාතු ව ම ඔහු මිය ගියේ නම් ඒ ව්‍යවස්ථා යටතේ ඔහු සම්බන්ධයෙන් දෙනු ලැබිය හැකි වූ ප්‍රදානයක් ඔහු සම්බන්ධයෙන් ගෙවිය හැකි ය; තවද

(ඇ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහුගේ ස්ථිර පත්වීම සිදු වූ අවස්ථාවේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ඔහු දායකයකු ව සිටියේ නම් ඒ ආඥාපනතේ කාර්යයන් සඳහා, සේවයෙන් පහ කිරීමක් නො වන වෙනත් ආකාරය කින් රජයේ කැමැත්ත ඇති ව ගිවිසුම අවසන් කිරීමෙන් පසු රජයේ සේවයෙන් ඔහු අස් වූ ලෙස සැලකිය යුතු ය.

(4) නිශ්චිත ව සඳහන් යම් කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීමට තමා එකඟ වන යම් ගිවිසුමකට රජය සමග ඇතුළු වී සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ යොදවන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනුලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යයන් සඳහා රජයට කරන ලද සේවය ලෙස සැලකිය යුතු ය.

## VII වන කොටස

## සාමාන්‍ය කරුණු

45. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ නියෝග. හෝ ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා ද නියම කළ යුතු යැ යි මේ පනතින් නියමිත හෝ නියෝග පැනවිය යුතු ය යි නියමිත සියලු ම කරුණු සම්බන්ධයෙන් ද ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකි ය.

(2) ඇමතිවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) ඇමතිවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පමණ ඉක්මණින් අනුමතිය සඳහා උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

එසේ අනුමත කරනු නොලැබූ එබඳු යම් නියෝගයක් අනුමත කරනු නො ලැබූ දින සිට අවලංගු වූ ලෙස සැලකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නො විය යුතු ය. ඇමතිවරයා විසින් පනවනු ලබන යම් නියෝගයක් අවලංගු වූ ලෙස එසේ සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

හිමිකම් පෑම් සමථයකට පැමිණවීමට මණ්ඩලයට ඇති බලය.

46. යම් තැනැත්තකු විසින් මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන යම් හිමිකම් පෑමක් හෝ ඉල්ලීමක් මණ්ඩලය විසින් ප්‍රමාණවත් යැ යි සැලකිය හැකි යම් මුදලක් හෝ වෙනත් වන්දියක් පිට මණ්ඩලය විසින් සමථයට පත් කළ හැකි ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව මණ්ඩලය උප ලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

47. මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

වාර්තා හා තොරතුරු.

48. මණ්ඩලය විසින්, හෝ මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්, දැන්වීමක් මගින්, මණ්ඩලයේ යුතුකම් හා කාර්යයන් මේ පනත යටතේ ඉටු කිරීමට මණ්ඩලයට හැකි වන පරිදි අවශ්‍ය විය හැකි යම් කරුණකට අදාළ තමා දන්නා සියලු වාර්තා හා තොරතුරු මණ්ඩලය වෙත හෝ ඒ නිලධරයා වෙත එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කළ යුතු කාලසීමාවක් ඇතුළත සපයන ලෙස යම් තැනැත්තකුට නියම කළ හැකි ය.

මණ්ඩලය සමග ගිවිසුම්වලට ඇතුළුවීම සඳහා සමාගම් ආදිය සතු බලය.

49. (නීතිගත කරනු ලැබූ හෝ නීතිගත නො කරනු ලැබූ) යම් රජයේ බලමණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් විසින්, තම කාර්යයන්ට අදාළ යම් ලිඛිත නීතියක හෝ නීත්‍යනුකූල ලේඛනයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මණ්ඩලයේ බලතල, කාර්යයන් හෝ යුතුකම් පාවිච්චි කිරීම, කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට මණ්ඩලය සමග ඇතුළත්වීම හා ඒවා ඉටු කිරීම කළ හැකි ය.

රජයේ දේපල හා ඇතැම් ගිවිසුම් සහ වගකීම් මණ්ඩලයට පැවරීම.

50. (1) ඇමතිවරයා විසින් (2) වන උපවගන්තියේ හා (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින්—

(අ) මණ්ඩලයේ කාර්යයන් සඳහා අවශ්‍ය රජයේ නිශ්චල හෝ චංචල යම් දේපළක්, හා

(ආ) ඒ කාර්යයන් හා සම්බන්ධ රජයේ යම් ගිවිසුම් හා වගකීම්

මණ්ඩලයට පැවරිය හැකි ය.

(2) මුදල් ඇමතිවරයාගේ එකඟත්වය නොමැතිව රජයේ කිසිදු චංචල දේපළක් සහ කිසිදු ගිවිසුමක් හෝ වගකීමක් (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයට නො පැවරිය යුතු ය.

(3) මුදල් ඇමතිවරයාගේ සහ තත්කාලයෙහි රජයේ ඉඩම් පිළිබඳ විෂය පවරනු ලැබ සිටින ඇමතිවරයාගේ එකඟත්වය නොමැතිව රජයේ කිසිම නිශ්චල දේපළක් (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයට නොපැවරිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු—

(අ) ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් දේපළ මණ්ඩලයට පැවරිය යුතු අතර ඒවා මණ්ඩලයේ දේපළ විය යුතු ය;

(ආ) ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් ගිවිසුම් මණ්ඩලයේ ගිවිසුම් ලෙස සැලකිය යුතු අතර ඒ ගිවිසුම් යටතේ රජය සතුව පවත්නා සියලු හිමිකම් හා බැඳීම් මණ්ඩලයේ හිමිකම් හා බැඳීම් ලෙස සැලකිය යුතු ය; තවද

(ඇ) ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් වගකීම් මණ්ඩලයේ වගකීම් ලෙස සැලකිය යුතු ය.

*අනිවාර්යයෙන් ඉඩම් අත්කර ගැනීමේ බලය.*

51. මණ්ඩලයේ යම් කාර්යයක් සඳහා රජයේ ඉඩමක් නො වන යම් ඉඩමක හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක යෝජිත අත් කර ගැනීම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් ඇමතිවරයා විසින් අනුමත කළ හැකි ය; තවද එබඳු ආඥාවක් එසේ පළ කරනු ලැබූ අවස්ථාවක ඒ ආඥාවෙහි නිශ්චිත ව සඳහන් ඉඩම හෝ යම් ඉඩමක සම්බන්ධතාව මහජන කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සැලකිය යුතු අතර එය ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ අත් කර ගනු ලැබිය හැකි ය; තවද එය එසේ අත් කර ගනු ලැබූ විට එය ඒ පනත යටතේ මණ්ඩලයට පැවරිය යුතු ය.

*ඇතැම් ආඥා පනත්වල විධිවිධානවලින් නිදහස් කිරීම.*

52. (1) ඉඩම් පිළිබඳ විෂය තත්කාලයෙහි භාරව සිටින ඇමතිවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පහත සඳහන් ආඥාපනත්වලින් යම් ආඥාපනතක යම් විධිවිධානයකින් මණ්ඩලය නිදහස් කළ හැකි ය:—

රජයේ ඉඩම් අයුතු ලෙස ඇදා ගැනීමේ ආඥාපනත;

රජයේ ඉඩම් ආඥාපනත;

මායිම් විස්තර කිරීමේ ආඥාපනත;

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත;

කැලෑ ආඥාපනත;

ඉඩම් සංවර්ධන ආඥාපනත.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවනු ලැබ පළ කරනු ලබන ආඥාවකට නීතියේ බලය තිබිය යුතු ය.

මණ්ඩලයේ විධාන අනුව මේ පනත යටතේ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

53. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලබන හෝ කරනු ලැබුවේ යැ යි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) තමා විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය අනුව සද්භාවයෙන් කරනු ලබන හෝ කරනු ලැබුවේ යැ යි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නො පැවරිය යුතු ය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරිපිටට ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතු අතර එබඳු යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවනු ලබන හෝ මණ්ඩලය විසින් අයකර ගනු ලබන යම් ගාස්තුවක් මණ්ඩලයේ අරමුදල්වලට බැර කළ යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය අනුව තමා විසින් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යැ යි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිටට (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකුට විරුද්ධව ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් දරනු ලබන යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යැ යි අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම් මණ්ඩලයේ අරමුදල්වලින් ගෙවිය යුතු ය.

ඇතැම් නීතිගත සංස්ථාවල කටයුතු මණ්ඩලය විසින් භාර ගත යුතු බව.

54. (1) ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් නියම කළ හැකි යම් දිනක සිට මණ්ඩලය විසින්, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ—

(අ) "කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ"; හා

(ආ) "කර්මාන්ත වතු නීතිගත සංස්ථාවේ"

කටයුතු භාරගෙන කර ගෙන යා යුතු ය.

(2) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ හා (1) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ නීතිගත සංස්ථාවල කටයුතු මණ්ඩලය විසින් භාර ගැනීමෙන් පසු මණ්ඩලය විසින්, එකී එක් එක් නීතිගත සංස්ථාවේ සෑම සේවකයකුටම මණ්ඩලය විසින් හා ඒ සේවකයා විසින් එකඟ විය හැකි නියමයන් හා කොන්දේසි අනුව රක්ෂා සැපයිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි හා (2) වන උපවගන්තියෙහි සඳහන් මණ්ඩලයේ යුතුකම් මණ්ඩලය විසින් කරගෙන යැමෙහි දී නියම ලෙස හෝ අනියම් ලෙස පැන නඟින සියලු කරුණු සම්බන්ධයෙන් නියෝග පැනවිය හැකි ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිභවා බලපැවැත් විය යුතු බව.

55. වෙන යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ වෙන යම් ලිඛිත නීතියේ විධිවිධාන අතර ගැටීමක් හෝ නො ගැලපීමක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

56. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ අර්ථ නිරූපණය පනතෙහි—

"රජයේ නියෝජ්‍යත්වය" යන්නෙන් යම් ලිඛිත නීතියකින් හෝ වෙනත් ආකාරයකින් පිහිටුවනු ලැබූ, රජය වෙනුවෙන් ක්‍රියාකරන යම් මණ්ඩලයක් හෝ යම් ආයතනයක් අදහස් වේ ;

"රජයේ අනුග්‍රහය ලබන නීතිගත සංස්ථාව" යන්න රජයේ අනුග්‍රහය ලබන නීතිගත සංස්ථා පනතේ ඊට දි ඇති අර්ථයම දරයි ;

"ප්‍රාදේශීය බලමණ්ඩලය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ ;

"රජයේ නිලධරයා" යන්න 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවෙහි ඊට දී ඇති අර්ථයම දරයි.